# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2256/57 – 2021 දෙසැම්බර් 03 වැනි සිකුරාදා – 2021.12.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2019/62.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශවයක් වශයෙන්,*

බී. එම්. බස්නායක මයා, ඇල්ල කඩේ බාරේ, කොට වෙහෙර ගලයාය, වරුණගම, වැල්ලවාය.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

1. සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම, අංක 27, මෙල්බෝන් ඇවනිව්, කොළඹ 04.
2. සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම - පැල්වත්ත, පුද්ගලික තැපැල් මල්ල, බුත්තල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මහනුවර, අනගාරික ධර්මපාල මාවත, අංක 129/8B, ''ජනහිරු'', කාංචන සිල්වා මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2021 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

1A – G 35504 – 15 (2021/12)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/02/2019/62.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

බී. එම්. බස්නායක මයා, ඇල්ල කඩේ බාරේ, කොට වෙහෙර ගලයාය, වරුණගම, වැල්ලවාය.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

1. සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම, අංක 27, මෙල්බෝන් ඇවනිව්, කොළඹ 04.

2. සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම - පැල්වත්ත, පුද්ගලික තැපැල් මල්ල, බුත්තල.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''බී. එම්. බස්නායක මහතාගේ සේවය අවසන් කිරීමෙන් ඔහුට අසාධාරණයක් සිදු වී තිබේ ද? එසේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 නොවැම්බර් මස 26 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 12 - 0036

---

මගේ අංකය: IR/COM/04/2019/308.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශවයක් වශයෙන්,*

ෆ්ලයිට් ඇටෙන්ඩන්ට්ස් යූනියන්, තට්ටු නිවාස 13, බෝගල කෝට්, ඩික්මන්ස් පාර, කොළඹ 05.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්, 3 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, කොළඹ 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී

ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බොරලැස්ගමුව, පිරිවෙන පාර, අංක 128, නීතීඥ එස්. විරිතමුල්ල මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2021 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2019/308.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

ෆ්ලයිට් ඇටෙන්ඩන්ට්ස් යූනියන්, තට්ටු නිවාස 13, බෝගල කෝට්, ඩික්මන්ස් පාර, කොළඹ 05.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්, 3 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, කොළඹ 01.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු** වනුයේ,

''ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ් ආයතනයේ ෆ්ලයිට් ඇටෙන්ඩන්ට්ස් යූනියන් සංගමය නියෝජනය කරන ගුවන් කාර්ය මණ්ඩල සේවකයින්ගේ සේවා නියුක්තියේ කොන්දේසියක් වශයෙන් සඳහන් අනියම් හා අසනීප නිවාඩු භුක්ති විඳීමට ඇති අයිතිය අහිමි කර තිබේ ද? එමගින් සේවකයින්ට අසාධාරණයක් සිදු වී තිබේද? එසේ නම් ලැබිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳ ව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 12 - 0037

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.